# පශ්චාත් යුධ ශ්‍රී ලංකා-ධනේෂ්වර යථාර්ථවාදය තුළ පාරිභෝගික අර්චනකාමය පාන්තික විඥානය සහ එහි දේශපාලන අවකාශය පිළිබඳව සංක්ෂිප්ත අධ්‍යයනයක්

**කල්ප රාජපක්ෂ**
ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙනිය විශ්ව විද්‍යාලය

***මූල පද:*** *පාරිභෝගික අර්චනකාමය; පාන්තික විඥානය; ධනේෂ්වර යථාර්ථවාදය; පශ්චාත් යුධ ශ්‍රී ලංකාව; විසම්මුතිවාදී ආර්ථික විද්‍යාව.*

## හැඳින්වීම

මෙම පර්යේෂණයේ මූලික ශාස්ත්‍රීය ප්‍රයත්නය වන්නේ ශ්‍රී ලංකා දේශපාලන ආර්ථික සන්දර්භය තුළ විකාශිත පාරිභෝගික අර්චනකාමය. පාන්තික විඥානය සහ එහි මානසික අවකාශය දේශපාලනික තලයේ ඇතිකරන බලපෑම පිළිබඳව දළ සංකල්පීය සටහනක් විසම්මුතිවාදී ආර්ථික විද්‍යාත්මක විධික්‍රමයක් හරහා ඉදිරිපත් කිරීම ය.

පරිභෝජනය එක් වටයකින් සම්පූර්ණ වන ක්‍රියාවක් නොවේ. එය එක් පරිභෝජන වටයක් අනෙක් පරිභෝජන වටය හා අවිච්ඡින්නව සම්බන්ධ කරනු ලබන සංකීර්ණතම, ද්‍රව්‍යාත්මක දෑ වරණය කරනු ලබන ක්‍රියාවලිය ලෙස සැලකිය හැක. එනිසා පරිභෝජනය අතිශයින් ද්‍රව්‍යාත්මක වන්නේ යම් සේ ද, ඒ තිව්‍රතාවයෙන් ම පරිභෝජනය ක්‍රියාවලිය විඥානික ද වේ. වෙනත් ආකාරයකට ප්‍රකාශ කරන්නේ නම් පරිභෝජනය යන ද්‍රව්‍යාත්මක ක්‍රියාවලිය, හුදුව ගත් විට, භුක්ති විඳීමේ ආර්ථික ක්‍රියාවලිය විසින් ඒ හා සාපේක්ෂ මානසික හැඟීම් ආර්ථිකයක් ද නිර්මාණය කිරීම අනිවාර්‍ය තත්ත්වය කි. එනිසාවෙන් පරිභෝජනය හුදු, එක් වටයකින් අවසන් වන, නිශ්ක්‍රීය ආර්ථික ක්‍රියාකාරකමක් නොවේ. පරිභෝජන ක්‍රියාවලිය තිව්‍ර ලෙස පුද්ගලයාගේ මෙන්ම සමාජ ක්‍රමයේ ද දිශානතිය වෙනස කරන තීරණාත්මක සාධකය බවට ගෝලීය ධනේශ්වරයේ ස්වර්ණමය අවධිය වන 1970- 1980 යන කාල වකවානුව තුළ පත් විය (Lee 1993; Sassatelli 2007, and Harvey 2010).

බොහෝ පර්යේෂකයන්ගේ අවධානය පර්භෝජනය සහ එහි සංස්කෘතිය විසින් ගෝලීය තලයේ ස්ථාපනය කරනු ලැබූ නව ලෝක දේශපාලනික රටාවකට අවශ්‍ය ප්‍රධාන කාරකය වශයෙන් පාරිභෝජනවාදය විසින් ආරෝපිත දේශපාලනික විඥානය විවිධ සන්දර්භයන් ඔස්සේ සාකච්චාවට බඳුන් කර ඇත (Lee 1993; Sassatelli 2007; and Parmentier and Fischer 2007). පරිභෝජනයේ භෞතික අභිමිවීම හෝ භෞතික සාක්ශාත් කර ගැනීම පුද්ගලයෙකුගේ සමාජ විඥානය නිර්මාණය කරනු ඇත. පරිභෝජනයේ අර්චනකාමය, නොඑසේ නම් කාර්ල්

මාර්ක්ස් ට අනුව පර්භෝජනයේ භාණ්ඩ මායාව/ඉන්ද්‍රජාලය, අනුක්‍රමයෙන් නිර්මාණය කර ඇත්තේ අර්චනකාමී සමාජ දේශපාලනික විඥානය කි. එම විඥානය තුළ පුද්ගලාර්ථය සහ සමාජාර්ථය අතර නොපියවෙන රික්තය තව දුරටත් ප්‍රසාරණය වෙමින් පවතී.

පශ්චාත් යුධ ශ්‍රී ලංකා සන්දර්භය අන් කවරදාටත් වඩා ගෘහීය සහ අන්තර්ජාතික තලයන් හිදී භූදේශපාලනික වශයෙන් සංවර්ධනය සහ සංහිඳියාව විෂයෙහි අත්පත් කරගෙන තිබූ ප්‍රගාමී දේශපාලන සංවාදයන් බිඳ වැටෙන සහ ක්‍රමයෙන් නව අර්බුධ තුළට ගමන් කරන ආකාරය පැහැදිළිව නිරීක්ෂණය කළ හැක.[5] අභ්‍යන්තරික වාර්ගික යුද්ධයකින් අනතුරුව දෙමළ ජාතික ගැටළුවට විශ්වසනීය සහ පරිකල්පනීය දේශපාලන විසඳුමක් සෙවීමට ජාතිකවාදී දේශපාලනයේ නියුතු දේශපාලන පක්ෂ අපොහොසත් වී ඇත. කතිකාවතකට යොමු වීම වෙනුවට ඔවුන්ගේ දේශපාලනික යොමුව වන්නේ ජාතිකවාදය සහ ඒ හා බැඳි පශ්චාත් යටත්විජිත යුගයේ පටන් පවත්වාගෙන ආ ආගම්වාදීත්වය ස්වකීය දේශපාලනය තුළට ඇද ගැනීම සහ ඒ මත ස්වකීය න්‍යාය පත්‍රය සකසා ගැනීමට ය. වාර්ගික සහ ආගමික වශයෙන් 'වර්ණාවලියක් සහිත' රාජ්‍යයන් බොහෝමයක ගැටුම් සහ අර්බුධ මතින් විකාශනය වන ජාතිකවාදී දේශපාලනයේ ස්වරූපය සහ පාන්තික විඥානය ගිලිහීම යන පෘථුල සංසිද්ධීන් පාරිභෝගික අර්චනකාමයේ ශ්‍රී ලංකා දේශපාලනයේ ස්වභාවය අධ්‍යයනය කිරීමට එක් පසකින් පර්යාවලෝකනයක් සපය යි.

මෙම පර්යෙෂණය විශේෂයෙන් ම උත්සහ දරා ඇත්තේ ද්‍රව්‍යාත්මක සංවර්ධනයේ අවිච්චින්න ඵලයක් වශයෙන් නැගෙන අර්චනකාමී පරිභෝජනවාදය ශ්‍රී ලංකා සන්දර්භය තුළ උද්ගත කර ඇති ප්‍රධාන සංසිද්ධීන් තුනක් ලෙස ද්‍රව්‍යාත්මක අත්පත් කර ගැනීම්වල ස්වභාවය හා ස්වරූපය, පංති සවිඥානිකත්වයේ රික්තය සහ වාර්ගික-ජාතිකවාදී දේශපාලනය ස්වකීය දේශපාලන ශක්තිය ගොඩනැංවීම සඳහා මෙම රික්තකය උපයෝගීකර ගන්නේ කෙසේද? යන්න පිළිබඳව ප්‍රාරම්භක සංකල්පීය රාමුවක් නිර්මාණය කිරීම ය.

**අරමුණු**

පරිභෝජනයේ පාන්තික වෙනස්කම් සහ බෙදීම ශ්‍රී ලංකා සන්දර්භය තුළ හඳුනා ගත හැක්කේ කෙසේද? සහ ඒ ඒ පන්තිවල පරිභෝජන අර්චනකාමීත්වයේ ස්වරූපය පිළිබඳව සිදුකළ හැකි නිරීක්ෂණ මොනවාද යන්න අධ්‍යයනය කිරීම. පාන්තික වශයෙන් ද්‍රව්‍යාත්මක නොලැබීයාම් පාන්තික විඥානය වෙනස් කිරීම පිළිබඳව දළ අධ්‍යයනයක් සිදු කිරීම. පාන්තික රික්තය තුළ අහිමි වන විඥානික

[5] වැඩිදුර කියවීම් The Tamil National Question in Sri Lanka: Current Dynamics and Future Trends, Sumanasiri Liyanage 2011 සහ Sri Lanka's Post-war Political Economy and the Question of Minorities, Ahilan Kadiragamar 2009

රූපණයන් මතවාදී දේශපාලනයක් ගොඩනැංවීම සඳහා සක්‍රීයව භාවිතකරන්නේ කවර ආකාරයෙන්ද යන්න අධ්‍යයනය කිරීම.

## ක්‍රමවේදය

පර්යේෂණය මූලධාර්මිකව ගුණාත්මක පර්යේෂණයක් වන අතර විස්තරාත්මක පර්යේෂණ වින්‍යාසයකින් සමන්විත වේ. විශේෂයෙන් ම ද්වීතියික දත්ත, පූර්ව පර්යේෂණ, සිද්ධි අධ්‍යයන යන දත්ත බාණ්ඩ පර්යේෂණය තුළ භාවිත කොට ගෙන ඇත.

පර්යේෂණ ක්‍රමවේදය සංවිධිත වන්නේ විවේචනාත්මක යතාර්ථවාදය සහ ඥාන මීමංසාත්මක ආන්තරාවාදය) යන විසම්මුතිවාදී ආර්ථික විද්‍යාව විසින් පෝෂණය කර පරිශීලනය කරනු ලබන පදනම්ගත න්‍යාය යන පර්යේෂණ ක්‍රමවේදයෙනි (Glaser and Strauss, 1967; and Lee F. 2012).

## පර්යේෂණ ප්‍රතිඵල

වර්ෂ 1977 සිට මේ දක්වා ආර්ථික දේහයට එන්නත් කරන ලද ක්‍රමික සහ විෂම නවලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති වල ඒකායන අරමුණ වුයේ වෙළඳපළ ආර්ථික දෘෂ්ටිවාදයක් මත පිහිටා වේගවත් සංවර්ධනයක් අත්පත් කරගැනිමය. නමුත් මෙම ද්‍රව්‍යාත්මක සංවර්ධනය සහ වෙළඳපළ ආර්ථික රෙජීමය උදකරගත් ද්‍රව්‍යාත්මක අත්පත්කරගැනීම් සහ එහි ව්‍යාප්තියේ ස්වරූපය තුළින් සංකීර්ණ හැඟීම් දේශපාලන ආර්ථිකයක් ඓතිහාසිකව, විශේෂයෙන් වාර්ගික වර්ණාවලිය තුළ සහ පන්ති සවිඥානිකත්වය තුළ නිර්මාණය කරනු ලැබ ඇත.

නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති විසින් වෙළඳපළ ආර්ථිකයක් යටතේ නිර්මාණය කරන ලද එක් තීරණාත්මක එමෙන් ම ජයගත නොහැකි අභියෝග බවට පත්වී ඇත්තේ ආර්ථිකය තුළ ආදායම් බෙදීයාමේ විශමතාව, කලාපීය වශයෙන් ආර්ථික ක්‍රියාකාරීත්වයේ අසමානතාවය - අසමබරතාවය සහ සෞභාග්‍යයේ ගමන් පථයෙන් මහජනතාවගෙන් සැලකිය යුතු කොටසක් ආන්තීකරණයට හෝ සම්පුර්ණයෙන් ම ඉවත්වීම ය.[6] වර්ෂ 1978 සිට වර්ෂ 2010 දක්වා බලයට පත් වූ විවිධ ආණ්ඩු විසින් මහජනතාවට ඉදිරිපත් කරන ලද මැතිවරණ පොරොන්දු ප්‍රකාශන වලින් පැනනගින එක් පොදු තත්ත්වයක් නම්, ඒ සියලුම ප්‍රකාශන දේශපාලනික අවස්ථාවාදීත්වයකින් ඉහත සඳහන් කළ වෙළඳපළ ක්‍රමය යටතේ ජයගත නොහැකි අභියෝග ත්‍රිත්වයේ සරල, මහජනතාවට සංවේදී තත්ත්වය වන පරිභෝජනය ශක්තිමත් කරන්නේ කෙසේද? සහ පරිභෝජනය ප්‍රසාරණය

[6] පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතක ව්‍යාප්තිය 2006- 2010 2006 බස්නාහිර පළාත 50.1 අතිරේක පළාත් සියල්ල 49.9% (උතුර 2.8%,නැගෙනහිර 4.9, උතුරු මැද 4.0, ඌව 4.3, මධ්‍යම 8.8, සබරගමුව 6.1, වයඹ 9.1 සහ දකුණු 10.0) 2010 බස්නාහිර පළාත 45.1% අතිරේක පළාත් සියල්ල 44.9 පළාත් අනුව ආදායම් ව්‍යාප්තියේ අසමානතාවය: 2009/ 2010 ආදායම් ලබනන්ගේ ආදායම අනුව ඉහළම ගිනි අගය සබරගමුව පළාත: 0.59 පහළම ගිනි අගය 0.45 සහ ශ්‍රී ලංකාව 0.55

කරන්නේ කෙසේද? යන කරුණු ඉස්මතු කොට දැක්වීම ය. එම තත්ත්වය ආර්ථික පද්ධතිය විසින් ම අභිමිකරන ලද **'ද්‍රව්‍යාත්මක අබ්බැහිකම්'** වෙනත් වටයකින් ස්වකීය බලදේශපාලනය න්‍යාය පත්‍රයට නතුකර ගැන්මක් ලෙස නිරීක්ෂණය කළ හැක.

විශේෂයෙන් ම ජාතිකවාදී දේශපාලනයේ නියුතු දේශපාලන පක්ෂ දෙකක් වන එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ස්වකීය දේශපාලන පොරොන්දු සහ ඒවායේ තාර්කික දර්ශනය ගිලා බස්වා ඇත්තේ ධනවාදී විධික්‍රමය තුළ නෛසර්ගිකව නොලැබී ගිය හෝ වෙළඳපළ පරිභෝජනවාදය තුළ අත්පත් කර ගැනීමේ තරගයෙන් හෙම්බත්වූ හෝ වෙළඳපළ පරිභෝජනවාදී තරගය මගින් සමස්ත මහජනතාවගෙන් අතලොස්සක් අත්පත්කරගත් ද්‍රව්‍යාත්මක සාධකයන් තමන්ටද අත්පත් කරගත හැකි වෙතැයි යන සංස්කෘතික ධනවාදයේ බලපෑමට නතු වූ මහජනතාවගේ ඓතිහාසිකව වැඩුනු සහ එක් එක් පරම්පරාවෙන් පරම්පරාවට විසරණය වූ අර්චනකාමී අපේක්ෂණයන් දේශපාලනික ශරීරයක් කොට ගනිමිනි. පරිභෝජනවාදී අපේක්ෂණ අතිශයින් මානුශීය සහ සරල ලෙස අර්ථ දැක්විය හැකි නමුත් එය යතාර්ථවාදී මෙන්ම සාධනීය අර්ථදැක්වීමක් නොවේ. ක්‍රමයෙන් පරිණාමයට සහ සංකීර්ණත්වයට පත්ව ඇති සමකාලීන පරිභෝජනවාදී සංස්කෘතිය පිළිබිඹු කරනුයේ සැබෑ මානව පරිභෝජන අවශ්‍යතාවන්ගෙන් මිදී මේ වන විට පුද්ගලයාගේ ද්‍රව්‍යාත්මක අර්චනය යන අන්තය තුළ ස්ථානගත ව ඇති බව යි.

අනුකරණවාදීත්වය පරිභෝජනවාදී අර්චනයේ ප්‍රධාන තීරකය කි. ශ්‍රී ලංකාව තුළඓතිහාසිකව ක්‍රියාත්මක වන්නේ ඉහල පන්ති වල පරිභෝජන රටාව අනුකරණවාදීව හබායන පහල මධ්‍යම පාන්තික සහ ඉහල මධ්‍යම පාන්තික ජීවිත වලින් නිර්මාණය වන අසම්පූර්ණ දේශපාලන ආර්ථික චල්‍යතාවයකි. පන්තීන් අතර පවත්නා ආර්ථික දේශපාලන සහ සංස්කෘතික බල රටාව, පන්තීමය විඥානය, ඊනියා ධනේශ්වර යථාර්ථවාදය මගින් නිෂ්ක්‍රීය කිරීම සහ අඛණ්ඩව සංකීර්ණත්වයට පත්වන ආර්ථික ක්‍රමය තුළ පන්තිමය අනන්‍යතාවන් වලට සම්මුඛවීමේ පොදු අවකාශය ගිලිහීයාම පොදුවේ අනුකරණවාදීත්වය පෝෂණය කරන පන්තිමය සන්දර්භය තුළ ඇති වූ සහ ඇති වෙමින් පවත්නා වෙනස්කම් ලෙස හඳුනා ගත හැක.[7] මෙම වෙනස්කම් වල අනෙක් බලපෑම නම් ඉහල ආදයම්, දේශපාලනික සහ සිවිල් බලය සන්කේද්‍රණය කරගත් පන්තින් සහ එවැනි සාධක අහිමි පහල පන්ති අතර පවත්නා හිඩැස අනුක්‍රමයෙන් විශාල වීම ය.

වර්ෂ 2009 න් අනතුරුව එළඹි අවධිය ශ්‍රී ලංකා දේශපාලන ආර්ථිකයට තීරණාත්මක වන්නේ ආදයම, දේශපාලනික බලය සහ සිවිල් බලය යන සාධක ත්‍රිත්වයම පදනම් කොටගෙන එක් අතකින් පන්තීමය හිඩැසෙහි සහ අනෙක් පසින් වාර්ගික රික්තයෙහි සිදුවෙමින් පවත්නා තිව්‍ර වෙනස්කම් නිසාවෙනි.මේ වෙනස්කම් දෙක විෂයෙහි ම පාරිභෝගික අර්චනකාමය විසින් පුද්ගලයාගේ ගාමක

[7] වැඩිදුර කියවීම: Distinction: A social critique of the judgment of taste, Pierre Bourdieu 1984 සහ The Theory of the leisure class, Thorestein Veblen 1899

දේශපාලනික විඥානය වෙනුවට අර්චනකාමී දේශපාලනික විඥානය අවස්ථාවාදීව ග්‍රහණය කර ගැනීම තීරණාත්මක බලපෑමක් ඇති කර ඇත.

**පර්යේෂණයේ නිගමන**

පර්යේෂණයෙන් ව්‍යුත්පන්න වන ප්‍රධාන සංකල්පීය තීසීස තුනක් අවධාරණය කළ හැක.

පළමු තීසීසය - අර්චනකාමයේ ප්‍රදර්ශකයෝ ආර්ථිකයේ පරිභෝජන ධූරාවලිය තුළ ධන සංකේන්ද්‍රණයේ ඉහලම ශක්‍යතාවන් සහිත සහ අධිපරිභෝජනවදයෙහි නියුතු සමාජ පන්තිය පරිභෝජනවාදී අර්චනකාමයේ සංස්කෘතික දේශපාලනික පරමාදර්ශය ලෙස තීරණය වී ඇත. ධනඋත්පාදනය, දේශපාලන සහ සිවිල් බලය වෙළඳපළ ආර්ථික රාමුව තුළ අභ්‍යාස කිරීමටත් ප්‍රතිව්‍යාප්ත කිරීමටත් මෙම පන්තිය සමත් ය.ඔවුහු ධනේශ්වර යතාර්ථවාදයේ ප්‍රදර්ශකයෝ ලෙස සැලකිය හැක.

දෙවන තීසීසය - **අර්චනකාමයේ ලුහුබඳින්නන්** ලුහුබඳින්නන්ගේ අපේක්ෂාව වන්නේ ඉහල පාන්තික අර්චනකාමී පරිභෝජනයේ ස්වරූපය අනුකරණය කිරීම ය. පුනරාවර්තීව ආර්ථික සාධක අත්පත් කර ගැනීම වෙනුවෙන් මෙම පරිභෝජන භාණ්ඩයට අයත් ප්‍රජාව ස්වකීය පාන්තික අවශ්‍යතා ඉතා තීරණාත්මක ලෙස විෂම, විකෘති, සමාජ විරෝධී සහ අදේශපාලනික මට්ටමකට පත් කොට ඇත. ලුහුබඳින්නන්ගේ පාන්තික් ඉලක්ක ප්‍රධාන වශයෙන් ; නවලිබරල්වාදයේ ඒකායන ද්‍රව්‍යාත්මක අත්පත්කර ගැනීමේ තර්කයෙන්, සංස්කෘතික ධනවාදයේ සමාජීය සහ ඉගැන්වීම් සහ ඉතා පුළුල්ව ගත්විට ආගමික, ජාතිකවාදී සහ ලිංගික යන සාමූහික අවිඥානිකත්වයන්ගේ අවරෝධනයට සහ උත්පේරණයට ලක් වී ඇත.

තෙවන තීසීසය- **රික්තකය තුළ පවතින දේශපාලන බලය** -ප්‍රදර්ශකයන් සහ ලුහුබඳින්නන් අතර පවත්නා අවකාශයට නැතිනම් රික්තකයට සිදුවන්නේ කුමක්ද? නොඑසේනම් අර්චනකාමයේ ද්‍රව්‍යාත්මක ලුහුබැදීම යන සමස්ත ක්‍රියාවලිය අතරතුර වන රික්තකය දේශපාලනික වශයෙන් පුද්ගල විඥානය වෙනස් කිරීමේ අතිශය තීරණාත්මක අවකාශයකි. මෙම රික්තකය ද්‍රව්‍යාත්මක නොලැබීයාම්, අහිමි කිරීම් සහ ආන්තිකකරණයන් මත ගොඩනැගුනු පීඩනය කි. මෙම සමස්ත මානසික දේශපාලන අවකාශය ශ්‍රී ලංකා දේශපාලන ආර්ථික සන්දර්භය තුළ ඉතා පුළුල්ව, විධිමත්ව සහ එක් එක් අවස්ථාවාදී බල ව්‍යාපෘතීන් හි අවිචාරශීලී න්‍යාය පත්‍ර තුළට නතු කර ගැනීමේ ස්වරූපය කාලාන්තරිකව අධ්‍යයනය කළ හැක. ජාතිකවාදී දේශපාලනික බල ව්‍යාපෘති සහ ආගමික අන්තවාදී බල ව්‍යාපෘති මේ රික්තකය විෂයෙ හි ආශක්ත වූ ප්‍රධාන දේශපාලනික බල කේන්ද්‍රයන් දෙකක් ලෙස ජනප්‍රිය දේශපාලනය තුළ හඳුනා ගත හැක.

ආශ්‍රිත


Harvey, D. (2010). The Enigma of Capital and the Crisis of Capitalism. FROFILE books. UK

Lee, Frederic. 2012. *Critical realism, grounded theory, and theory construction in heterodox economics. Available at* http://mpra.ub.uni-muenchen.de/40341/

Lee, Martyn. J. 1993. Consumer Culture Reborn: The cultural politics of Consumption. Routledge. London

Liyanage, Sumanasiri. 1997. The State, State Capital and Capitalistic Development. Dilemmas of Development: Fifty years of Economic change in Sri Lanka. Ed. W.D. Lakshaman. Sri Lanka Association of Economics

Sassatelli, Roberta. 2007. Consumer Culture History, Theory and Politics. SAGE publications. London